**ජාතික ආරක්ෂක අරමුදල - 2019**

**------------------------------------**

## 1.1 තත්ත්වාගණනය කළ මතය

**------------------------------**

ජාතික ආරක්ෂක අරමුදල 2019 දෙසැම්බර් 31 දිනට ශේෂ පත්‍රය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ ආදායම් වියදම් ගිණුම සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා මුදල් ප්‍රවාහ ප්‍රකාශනය සහ මූල්‍ය ප්‍රකාශනවලට අදාළ සටහන්, සාරාංශගත වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්තිවලින් සමන්විත 2019 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන 1985 අංක 09 දරණ ජාතික ආරක්ෂක අරමුදල් පනතේ 12 (2) වගන්තිය සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(3) ව්‍යවස්ථාව හා 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ විධිවිධාන ප්‍රකාරව මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(6) ව්‍යවස්ථාව ප්‍රකාරව පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කළ යුතු යැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ.

මෙම වාර්තාවේ 1.5 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, අරමුදලේ 2019 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය කාර්යසාධනය හා මුදල් ප්‍රවාහ සත්‍ය හා සාධාරණ ලෙස දැක්වෙන අයුරින් ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කර ඇති බව මා දරන්නා වූ මතය වේ.

## 1.2 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම

**---------------------------------------------**

මෙම වාර්තාවේ 1.5 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මාගේ මතය තත්ත්වාගණනය කරනු ලැබේ.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර.) අනුකූලව මා විගණනය සිදු කරන ලදි. මෙම විගණන ප්‍රමිති යටතේ වූ මාගේ වගකීම, මෙම වාර්තාවේ මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ තත්ත්වාගණනය කළ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

## 1.3 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ සහ ඊට සම්බන්ධ පාර්ශවයන්ගේ වගකීම්

**---------------------------------------------------------------------------------------------**

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා රාජ්‍ය අංශයේ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍ය වන අභ්‍යන්තර පාලනයන් තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේදී, අරමුදල අඛණ්ඩව පවත්වාගෙන යාමේ හැකියාව තීරණය කිරීම කළමනාකරණයේ වගකීමක් වන අතර, කළමනාකාරීත්වය අරමුදල ඈවර කිරීමට අදහස් කරන්නේ නම් හෝ වෙනත් විකල්පයක් නොමැති විටදී මෙහෙයුම් නැවැත්වීමට කටයුතු කරන්නේ නම් හැර අඛණ්ඩ පැවැත්මේ පදනම මත ගිණුම් තැබීම හා අරමුදලේ අඛණ්ඩ පැවැත්මට අදාළ කරුණු අනාවරණය කිරීමද කළමනාකරණයේ වගකීමකි.

අරමුදලේ මූල්‍ය වාර්තාකරණ ක්‍රියාවලිය සම්බන්ධ වගකීම, සම්බන්ධ පාර්ශව විසින් දරනු ලබයි.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) උප වගන්තිය ප්‍රකාරව, අරමුදලේ වාර්ෂික සහ කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වාගෙන යාම අවශ්‍ය කෙරේ.

## 1.4 මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම

---

සමස්තයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා සහ වැරදි නිසා ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණකගේ වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතික වීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සෑම විටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන් අනාවරණය කරගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන් ඇතිවිය හැකි අතර, මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කරගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි බලපෑමක් විය හැකි බව අපේක්ෂා කෙරේ.

මා විසින් වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසු බවින් යුතුව ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය කරන ලදි. තවද,

- වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගේ අවදානම් හඳුනාගැනීමේදී හා තක්සේරු කිරීමේදී අවස්ථාවෝචිතව උචිත විගණන පටිපාටි සැලසුම් කිරීමෙන් වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවන්නාවූ අවදානම් මඟහරවා ගැනීමට, ප්‍රමාණවත් සහ සුදුසු විගණන සාක්ෂි ලබාගැනීම මාගේ මතයට පදනම් වේ. වරදක් නිසා සිදුවන බලපෑමට වඩා වංචාවක් හේතුවෙන් සිදුකරන ලද ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයක් හඳුනා නොගැනීම මඟින් සිදුවන්නාවූ බලපෑම ප්‍රබල වන අතර, දුස්සන්ධානය, ව්‍යාජ ලේඛන සැකසීම, චේතනාන්විත මඟහැරීම හෝ අභ්‍යන්තර පාලනයන් මඟහැරීම වංචාවක් ඇතිවීමට හේතුවේ.

- අවස්ථාවෝචිතව උචිත විගණන පටිපාටි සැලසුම් කිරීම පිණිස අරමුදලේ අභ්‍යන්තර පාලනය සම්බන්ධයෙන් අවබෝධයක් ලබා ගන්නා ලද නමුත්, අභ්‍යන්තර පාලනයේ සඵලදායීත්වය පිළිබඳ මතයක් ප්‍රකාශ කිරීමට අදහස් නොකරයි.

- කළමනාකරණය විසින් අනුගමනය කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය සහ යොදා ගන්නා ලද ගිණුම්කරණ ඇස්තමේන්තුවල හා සම්බන්ධිත හෙළිදරව් කිරීම්වල සාධාරණත්වය ඇගයීම.

- සිද්ධීන් හෝ තත්ත්වයන් හේතුවෙන් අරමුදලේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ ප්‍රමාණාත්මක අවිනිශ්චිතතාවයක් තිබේද යන්න සම්බන්ධයෙන් ලබාගත් විගණන සාක්ෂි මත පදනම්ව ගිණුම්කරණය සඳහා ආයතනයේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ පදනම යොදා ගැනීමේ අදාළත්වය තීරණය කරන ලදි. ප්‍රමාණවත් අවිනිශ්චිතාවයක් ඇති බවට මා නිගමනය කරන්නේ නම් මූල්‍ය ප්‍රකාශනවල ඒ සම්බන්ධයෙන් වූ හෙළිදරව්කිරීම්වලට මාගේ විගණන වාර්තාවේ අවධානය යොමු කළ යුතු අතර, එම හෙළිදරව් කිරීම ප්‍රමාණවත් නොවන්නේ නම් මාගේ මතය විකරණය කළ යුතු වේ. මාගේ නිගමනයන් විගණකගේ වාර්තාවේ දිනය දක්වා ලබා ගන්නා ලද විගණන සාක්ෂි මත පදනම් වේ. කෙසේ වුවද, අනාගත සිද්ධීන් හෝ තත්ත්වයන් මත අඛණ්ඩ පැවැත්ම අවසන් විය හැකිය.

- හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය සහ අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණ අයුරින් මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත් බව ඇගයීම.

හැකිතාක් දුරට හා අවශ්‍ය ඕනෑම විටෙක පහත සඳහන් දෑ පරීක්ෂා කිරීම සඳහා විගණන විෂය පථයද පුළුල් කර ඇත.

- තොරතුරු ඉදිරිපත් කිරීම සම්බන්ධයෙන් බලන කළ අරමුදලේ කාර්යයන් අඛණ්ඩව ඇගයීමට හැකිවන පරිදි එහි සංවිධානය, පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි විධිමත්ව හා ප්‍රමාණාත්මකව සැලසුම් කර තිබේද යන බව සහ එකී පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි ඵලදායී ලෙස පවත්වාගෙන යනු ලැබේ ද යන බව;

- යම් අදාළ ලිඛිත නීතියකට හෝ අරමුදලේ පාලක මණ්ඩලය විසින් නිකුත් කරන ලද වෙනත් පොදු හෝ විශේෂ විධානයකට අනුකූලව, අරමුදල ක්‍රියා කර ඇති බව,

- සිය බලතල, කර්තව්‍ය සහ කාර්යයන්ට අනුකූලව කටයුතු කර ඇති බව,

- සම්පත් සකසුරුවම් ලෙස, කාර්යක්ෂම ලෙස සහ ඵලදායී ලෙස කාලසීමාවන් තුළ සහ අදාළ නීතිරීතිවලට අනුකූලව ප්‍රසම්පාදනය කර භාවිතා කර ඇති බව.

## 1.5 මූල්‍ය ප්‍රකාශන

-----------------

### 1.5.1 මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම පිළිබඳ අභ්‍යන්තර පාලනය

-------------------------------------------------------------

ගනුදෙනු කළමනාකාරීත්වයේ පොදු සහ නිශ්චිත අධිකාරීබලය සහිතව ක්‍රියාත්මක කිරීම, අදාළ වන වාර්තාකරණ ප්‍රමිතිවලට අනුකූලව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට අවශ්‍ය වන පරිදි ගනුදෙනු සටහන් කිරීම සහ වත්කම් සඳහා ගිණුම් කටයුතුභාවය පවත්වාගෙන යාම, කළමනාකාරීත්වයේ පොදු සහ නිශ්චිත අධිකාරී බලය සහිතව පමණක් වත්කම්වලට ප්‍රවේශ වීම, සටහන් කරන ලද වත්කම් සඳහා වූ ගිණුම් කටයුතුභාවය පවත්නා වත්කම් සමඟ සාධාරණ කාල වකවානුවලදී සැසඳීම සහ වෙනස්කම් ඇතොත් ඒවා සම්බන්ධයෙන් නිසි පියවර ගැනීම ආදිය සඳහා සාධාරණ තහවුරුවක් ලබාගැනීමට ප්‍රමාණවත් "මනාලෙස සැලසුම් කරන ලද" අභ්‍යන්තර ගිණුම්කරණ පාලන පද්ධතියක් ආයතනය විසින් පවත්වාගෙන යාම අවශ්‍ය වේ.

### 1.5.2 ගිණුම්කරණ අඩුපාඩු

---------------------

පහත සඳහන් නිරීක්ෂණය කරනු ලැබේ

| | විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | දිගින් දිගටම අරමුදල විසින් විරුසිසු ප්‍රදීප ශිෂ්‍යත්ව වැඩසටහන ක්‍රියාත්මක කර තිබුණද ඉන් බැහැරව පෞද්ගලික බැංකුවක් විසින් 5 වසර ශිෂ්‍යත්වය සමත් රණවිරු සිසුන් 300 ක් සඳහා රු.25,000 බැගින් රු. 7,500,000 ක් පරිත්‍යාග කර තිබුණි. එම ගනුදෙනුව ගිණුම්වලින් අනාවරණය කර නොතිබුණි. | පෞද්ගලික බැංකුවක් විසින් සෘජුවම ශිෂ්‍යත්වලාභීන් සඳහා බැංකු ගිණුම් විවෘත කොට මුදල් තැන්පත් කර ඇත. මෙවැනි පරිත්‍යාග ඉදිරියේ සටහනක් මාර්ගයෙන් මූල්‍ය ප්‍රකාශන වල ඇතුලත් කිරිමට සටහන් තබා ගන්නා ලදි. | අරමුදලට අදාල ගනුදෙනු ගිණුම්වලින් අනාවරණය විය යුතුයි. |

| | | | |
|---|---|---|---|
| (ආ) | ගිණුම් විෂයන් 04 ක් සම්බන්ධයෙන් මූල්‍ය ප්‍රකාශන වල දක්වා ඇති වටිනාකම් සහ ඒ සඳහා ඉදිරිපත් කර ඇති උපලේඛණය/ විගණන ගණනය කිරීම් අතර රු. 804,518 ක වෙනස්කම් නිරික්ෂණය විය | ආයෝජන ,ආයෝජන පොලී වල ගණනය කිරීමේ සහ සටහන් කිරීමේ දෝෂ නිවැරදි කිරීමට සටහන් තබා ගන්නා ලදී.තවද ප්‍රතිලාභ උත්සවයේ වියදම් හා විරු සිසු ප්‍රදීප ශිෂ්‍යත්ව වියදමෙහි සටහන් කිරීමේ දී දෝෂයක් ඇත. | මූල්‍ය ප්‍රකාශන සහ අදාල ලෙජර් ගිණුම්, උපලේඛන වල නිවැරදි අගයන් දැක්විය යුතුය. |

**1.5.3 විගණන සාක්ෂි නොමැති වීම**

------------------------------

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| ශේෂ පත්‍රයේ රු. 55,700,759 ක ස්ථාවර වත්කම් සම්බන්ධව ස්ථාවර වත්කම් ලේඛණ හා සමීක්ෂණ මණ්ඩල වාර්තා විගණනයට ඉදිරිපත් නොවුණි. | ස්ථාවර වත්කම් ලේඛනය නඩත්තු කිරීමටත් සමීක්ෂණ වාර්තා විගණනය වෙත ඉදිරිපත් කිරීමටත් කටයුතු කරනුලැබේ. | මූල්‍ය ප්‍රකාශන විගණන සඳහා ස්ථාවර වත්කම් ලේඛණ හා සමීක්ෂණ වාර්තා ඉදිරිපත් කල යුතුය. |

**1.6 නීති රීති, රෙගුලාසි සහ කළමනාකරණ තීරණ ආදියට අනුකූල නොවීම**

---------------------------------------------------------------------------

| | නීති,රීති ,රෙගුලාසි ආදියට යොමුව | අනුකූල නොවීම | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|---|
| (අ) | 1985 අංක 09 දරන ආරක්ෂක අරමුදල් පනත | | | |
| | (i) 9 වගන්තිය | තම රාජකාරී ඉටුකරන අතර තුර තුවාල ලැබූ හෝ මියගිය පොලිස් බලකායේ යම් සාමාජිකයකුගේ පවුල් වලට සහන සැලසීම සහ ජාතික ආරක්ෂාව ප්‍රවර්ධනය සහ සහතික කිරීම සඳහා අරමුදලේ මුදල් උපයෝජනය කල යුතු බව සඳහන් වුවද සමාලෝචිත වර්ෂය තුලදී ඒ සඳහා වැඩසටහන් සැලසුම් කර ක්‍රියාත්මක කර නොතිබුණි. | පනතේ අරමුණු පිළිබඳව වර්තමාන පාලක මණ්ඩලය අදහස් කරන ආකාරයට ඉදිරි කටයුතු කිරීමට අපේක්ෂිතය. තවද 2019 වර්ෂය තුළදී පොලිස් නිලධාරීන්ගේ දරුවන් 25 කට ප්‍රතිලාභ ලබාදී ඇත. 2020 වසරේ පොලිස් නිලධාරීන් 100 ක් සඳහා නිවාස ප්‍රතිලාභ සහ දරුවන් 25ක් සඳහා ශිෂ්‍යත්ව ප්‍රතිලාභ ලබාදීමට අරමුදලේ පාලකමණ්ඩය අනුමතකර ඇත. | පනතේ 09 වන වගන්තියේ විධිවිධාන ප්‍රකාරව කටයුතු කල යුතුය. |

| | | | | |
|---|---|---|---|---|
| | (ii) 13 වගන්තිය | අරමුදලේ 2016 වර්ෂයේ සිට 2019 වර්ෂය දක්වා මූල්‍ය ප්‍රකාශන සහ විගණකාධිපති වාර්තා පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කර නොතිබුණි. | පනතේ 2018 අංක 16 හා 2018.06.22 දිනැති සංශෝධනය අනුව 2018 වර්ෂය සඳහා විගණකාධිපති වාර්තාව සභාගත කිරීමට කටයුතු ආරම්භ කර ඇත. | පනතේ 13 වගන්තිය විධිවිධාන ප්‍රකාරව කටයුතු කල යුතුය. |
| (ආ) | ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි සංග්‍රහය | | | |
| | (i) මුදල් රෙගුලාසි 133 | අරමුදල සඳහා අභ්‍යන්තර විගණනයක් සිදුකර නොතිබුණි. | පිලිතුරු දී නොමැත. | මුදල් රෙගුලාසි ප්‍රකාරව කටයුතු කල යුතුය. |
| | (ii) මුදල් රෙගුලාසි 395 (ආ) | ශ්‍රී ලංකා මහබැංකුවේ පවත්වාගෙන යනු ලබන ජංගම ගිණුම සඳහා බැංකු සැසඳුම් පිළියෙල කර නොතිබුණි. | 2019 වර්ෂය සඳහා බැංකු සැසඳුම් පිලියෙල කර විගණනය සඳහා ඉදිරිපත් කිරීමට කටයුතු කරනු ලැබේ. | මුදල් රෙගුලාසි ප්‍රකාරව කටයුතු කල යුතුය. |
| (ඇ) | 2016 මාර්තු31 දිනැති 05/2016 දරන රාජ්‍ය මුදල් චක්‍රලේඛය හා මුදල් රෙගුලාසි අංක 756 | චක්‍රලේඛ හා මුදල් රෙගුලාසි ප්‍රකාරව අරමුදල සඳහා සමාලෝචිත වර්ෂයේ භාණ්ඩ සමීක්ෂණ වාර්තා 2020 අගෝස්තු 31 දින දක්වාත් විගණකාධිපති වෙත ඉදිරිපත් කර නොතිබුණි. | 2019 සිට ඉදිරියට භාණ්ඩ සමීක්ෂණ පැවැත්වීමට කටයුතු කරනු ලැබේ. | මුදල් රෙගුලාසි හා චක්‍රෙල්ඛය ප්‍රකාරව කටයුතු කල යුතුය. |

## 1.7 මුදල් කළමනාකරණය

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| ශ්‍රී ලංකා මහබැංකුවේ පවත්වාගෙන යනු ලබන ජංගම ගිණුමේ රු.මිලියන 5 ක මුදලක් මාස 03 ක කාලයක් ඵලදායී ආයෝජනය කිරීමකින් තොරව පැවැතිණි. | නොවැලැක්විය හැකි හේතු මත යම් ප්‍රතිලාභ ගෙවීමක් ප්‍රමාද කිරීමට සිදුවුවහොත් ඊට අදාල මුදල මෙම ගිණුම තුල රඳවා ගැනීමට සිදු වේ. එම මුදල තාවකාලිකව ආයෝජන වල යෙදවීම ප්‍රායෝගිකව සිදු කල නොහැකිවේ. | අතිරික්ත මුදල් ප්‍රමාදයකින් තොරව ආයෝජනය කල යුතුවේ. |

## 2. මූල්‍ය සමාලෝචනය

### 2.1 මූල්‍ය ප්‍රතිඵල

සමාලෝචිත වර්ෂයේ මෙහෙයුම් ප්‍රතිඵලය රු. 74,497,183 ක ඌනතාවයක් වූ අතර ඊට අනුරූපීව ඉකුත් වර්ෂයේ ඌනතාවය රු. 87,869,225 ක් විය. ඒ අනුව මූල්‍ය ප්‍රතිඵලයෙහි රු.13,372,042 ක වර්ධනයක් නිරීක්ෂණය විය. ආදායම රු. 28,529,826 කින් පහළ ගියද මෙත් සෙවන නිවාස ප්‍රත්ලාභ ගෙවීම් වියදම රු.39,740,279 කින්ද, විරු සිසු ප්‍රදීප ශිෂ්‍යත්ව සඳහා වියදම රු. 3,565,920 කින් පහළ යාම මෙම වර්ධනයට ප්‍රධාන වශයෙන් හේතු වී තිබුණි.

## 3. මෙහෙයුම් සමාලෝචනය

### 3.1 කළමණාකරණ අකාර්යක්ෂමතා

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| රණවිරු නිවාස ප්‍රතිලාභ ප්‍රධානය කිරිමේදී උත්සව කටයුතු සඳහා රු. 1,792,295 ක් සහ එම කටයුතු මුද්‍රිත මාධ්‍ය මගින් ප්‍රචාරණය කිරීම වෙනුවෙන් රු.626,750 ක් වශයෙන් එකතුව රු.2,419,045 ක වියදම් සමාලෝචිත වර්ෂයේදී අරමුදලින් දරා තිබුණි. | ජාතික ආරක්ෂක අරමුදල මගින් සමාලෝචිත වර්ෂය තුලදී රු.මි. 160 ක පමණ සුභසාධන කටයුතු සිදුකර ඇත. එමගින් රණවිරුවන්ගේ චිත්ත ධෛර්ය ප්‍රවර්ධනය කිරීමට සහ අරමුදල වෙත මූල්‍ය දායකත්වයන් දැක්වීමට මහජනතාව දැනුවත් කිරීමට අපේක්ෂා කරන ලදී. | පනතේ සඳහන් අරමුණු ඉටුකිරීම සඳහා අරමුදලේ මුදල් වියදම් කල යුතුය. |

## 4. ගිණුම් කටයුතුභාවය සහ යහපාලනය

### 4.1 වාර්ෂික ක්‍රියාකාරී සැලැස්ම

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| 2014 පෙබරවාරි 17 දිනැති අංක 01/2014 දරණ රාජ්‍ය මුදල් චක්‍රලේඛයේ 04 ජේදය ප්‍රකාරව සමාලෝචිත වර්ෂය සඳහා සකස්කර තිබූ ක්‍රියාකාරී සැලැස්ම අවශ්‍ය තොරතුරු ඇතුලත්වී නොතිබුණි. | 2020 වසරේ ක්‍රියාකාරී සැලැස්මේ එම තොරතුරු ඇතුළත් කර ඇත. | චක්‍රලේඛය ප්‍රකාරව ක්‍රියාකාරී සැලැස්මක් සකස් කළ යුතුය. |

**4.2** **අයවැය පාලනය**

| **විගණන නිරීක්ෂණය** | **කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම** | **නිර්දේශය** |
| --- | --- | --- |
| සමාලෝචිත වර්ෂයේ අරමුදලේ අයවැය ලේඛණය ඵලදායී කළමනාකරණ පාලන කාරකයක් ලෙස උපයෝගී කරගෙන නොතිබුණි. | ඉදිරියේදී අයවැය ලේඛනය ඵලදායී කළමනාකරණ පාලන කාරකයක් ලෙස උපයෝගි කර ගැනීමටත් කටයුතු කෙරේ. | අයවැය ලේඛණය ඵලදායී කළමනාකරණ පාලන කාරකයක් ලෙස උපයෝගීකර ගැනීම කල යුතුය. |

**4.3** **තිරසර සංවර්ධන අරමුණු**

| **විගණන නිරීක්ෂණය** | **කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම** | **නිර්දේශය** |
| --- | --- | --- |
| 2017 අංක 19 දරන ශ්‍රී ලංකා තිරසර සංවර්ධන පනත හා ජනාධිපති ලේකම්ගේ 2018 මාර්තු 16 දිනැති අංක පීඑස්/එස්පී/එස්බී/3/201 දරන චක්‍රලේඛය අනුව අරමුදලට අදාල තිරසර සංවර්ධන අරමුණු ,ඉලක්ක හා එම ඉලක්ක මැනීමේ දර්ශක හදුනාගෙන නොතිබුණි. | අරමුදලේ අරමුණු හා සමපාත වන තිරසාර සංවර්ධන අරමුණු ළගා කර ගැනීමට ඉදිරියේදි අපේක්ෂා කෙරේ. | පනත හා චක්‍රලේඛය ප්‍රකාරව කටයුතු කල යුතුය. |